පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 1

විෂය:- නාට්‍ය හා රංගකලාව

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# කංකාරි රග ලකුණ විමසමු

## කොහොඹා කංකාරි ශාන්ති කර්මය

දේශීය නාට්‍ය කලාවේ ආරම්භය පිළිඹද සොයා බැලීමේදී පැහැදිළි වන කරුණක් වන්නේ දේශීය ශාන්කි කර්ම වල දක්නට ලැබෙන අන්තර් රංග අවස්ථා හෙවත් නාට්‍යමය පෙළපාලි තුලින් දේශීය නාට්‍ය කලාවේ මුල බීජය ඇතිවූ බවයි. එය මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසින් ලියන ලද **සිංහල ගැමි නාටකය** නම් ග්‍රන්ථයේද සදහන්ය.

කොහොඹා කංකාරිය යනු උඩරට නර්තන සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරයයි. එනිසාම මෙම ශාන්ති කර්මය උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිතව ඇති උඩු නුවර, යටි නුවර , දුම්බර,හේවාහැට, හාරිස්පත්තුව,සත්කෝරලය හා සතර කෝරලය යන ප්‍රදේශ වලට අයත් නගර කේන්ද්‍රගත කරගෙන ප්‍රචලිත වී ඇත.

ප්‍රථම කොහොඹාකංකාර්ය පවත්වා ඇත්තේ විජය රජුගෙන් පසු ලංකාවේ රජ කළ පඩුවස් දෙව් රජුට වැළදුනු දිවි දෝෂයක් සුව කිරීම සඳහා අනුරාධපුර මහමෙවුනා උයනේදීය. ඉන් පසු කොහොඹා කංකාරිය පැවැත්වීමේ පරමාර්ථ වන්නේ

- ගමට රටට සෞභාග්‍ය හා සශ්‍රිකත්වය ප්‍රාර්ථනා කිරීම
- තමන්ගේ භව භෝග සම්පත් සරුකර දුන් දෙවිවරුන්ට ස්තුති කිරීම
- ස්වාභාවික උවදුරු වලින් ආරක්ෂා වීම
- අපල උපද්‍රව මග හරවා ගැනීම

- අධ්‍යාපනික අවශ්‍යතා සඳහා
- විනෝදාස්වාදය සඳහා

මෙම ශාන්තිකර්මයේදී පුද ලබන්නේ කොහොඹා දෙවිවරුය. කංකාරිය කරන ඇදුරන් යක්දෙස්සන් ලෙස හඳුන්වති .ඔවුන්ගේ ඇඳුම වෙස් ඇඳුම් කට්ටලයයි. ගැට බෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.

## කොහොඹා කංකාරියේ උපත් කතාව

ලංකාවේ සිටි යක්ෂ ගෝත්‍රික කාන්තාවක් වන කුවේනි තම වැඩිහිටියන්ට ද්‍රෝහීවී ඉන්දියාවේ සිට පැමිණි විජය කුමරුට රජකම ලබා ගැනීමට සහය වි ඔහුගේ බිරිඳද වූවාය.විජය කුවේනි දෙපලට දරු දෙදෙනෙකුද ලැබුණු පසු විජය තම සියළු පොරොන්දු අමතක කර කුවේනි හා දරු දෙදෙනා මාලිගයෙන් පන්නා දමා ඉන්දියාවෙන් කුමාරිකාවක් ගෙන්වා ඇය සරණපාවා ගෙන ලක්දිව රජ කෙරීය. කුවේනිය දරු දෙදෙනා සමග මාලිගයෙන් පිටව යන්නේ විජය රජුට සාප කරමිනි. කුවේනිය තම ඥාතීන් අතින් මියයයි .දරුවෝ වනයේ අතරමන් වෙති. විජය රජු මිය ගිය පසු ලක්දිව රජ වන්නේ පඩුවස්දෙව් රජුය. කුවේනියගේ සාපය පඩුවස්දෙව් රජුට බලපායි. ඔහු නිතරම නිදි යහනේදී දිවියෙක් සිහිනෙන් දැක බිය වේ. නින්ද නොයයි. රජු රෝගී වේ . කොපමණ ප්‍රතිකාර කළද සුව නොවේ. මෙය සැළවූ සක්‍ර දේවේන්ද්‍රයා රජුගේ රෝගය සුව කිරීමට නම් එකළ ඉන්දියාවේ රජකල මලය රජු ගෙන්විය යුතු බව පවසා එම කාර්ය කිරීමේ වගකීම ඊශ්වරයාට භාර දුණි .ඊශ්වරයා එය රාහු අසුරේන්ද්‍රයාට භාර දුන් අතර රාහු අසුරේන්ද්‍රයා ඌරු වේෂයක් මවාගෙන ඉන්දියාවේ මලය රජුගේ මගුල් උයනට ගොස් එය විනාශ කරන්නට විය.කෝපයට පත් මලය රජු ඌරා මරාදැමීමේ චේතනාවෙන් ඌරා පසුපස පන්නන්නට විය. රාහු අසුරේන්ද්‍රයා උපක්‍රමශීලීව මලය රජු ලංකාවේ මහනුවර හන්තාන කන්ද දක්වාම රැගෙන විත් තම ඌරු වේෂයෙන් මිදී මලය රජු මෙරටට ගෙන්වීමට හේතුව පැවසීය.පසුව මලය රජු පඩුවස්දෙව් රජ මුණගැසි අවශ්‍ය බඩු බාහිරාදිය සපයාගෙන අනුරාධපුර මහමෙවුනා උයනේදී අලංකාර මඩුවක් සාදවා එහි කොහොඹා කංකාරිය ශාන්ති කර්මය කරවා රජු සුවපත් කල බවත් පැවසේ.